# වැලිමඩ ප්‍රාදේශීය සභාවේ මහ සභා රැස්වීම් වාර්තාව - 2025.12.26

**පිළිගැනීම**

2025 වර්ෂයේ දෙසැම්බර් මස 26 වන සිකුරාදා දින පෙ.ව.09.00 ට මුලාසනය දැරූ ගරු සභාපතිතුමා විසින් ගරු උප සභාපතිතුමා, ගරු මන්ත්‍රී මණ්ඩලය , සභා ලේකම්තුමා , කාර්ය මණ්ඩලය ඇතුළු සියළු දෙනා පිළිගැනීමෙන් අනතුරුව සභාවේ වැඩ කටයුතු ආරම්භ කරන ලදි

.

**පැමිණීම**

**සහභාගි වූ ගරු මන්ත්‍රීවරුන්ගේ නාම ලේඛනය**

1. ගරු සභාපති ඩී.එම්. අජිත් කුමාර මැතිතුමා
2. ගරු උපසභාපති එම්.එල්.එම්. සෆ්වාන් මැතිතුමා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.එම්.ඉන්දික සම්පත් මැතිතුමා
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එම්.දයාරත්න මැතිතුමා
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.එම්.ප්‍රභාත් රවීන්ද්‍ර ගුණසේකර මැතිතුමා
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එම්.කරුණාරත්න මැතිතුමා
7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.වී.එන්.කුසුම් කුමාරි මැතිණිය
8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මොහොමඩ් හලීම් මොහොමඩ් ෆායිස් සයිබු මැතිතුමා
9. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.එම්.අජිත් ප්‍රේමලාල් මැතිතුමා
10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටි.එම්.චන්ද්‍රිකා තෙන්නකොන් මැතිණිය
11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.ඒ.ප්‍රියන්ත චාමින්ද මැතිතුමා
12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්. මහේෂ් කෝසල රාජකරුණා මැතිතුමා
13. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්. සරත් කුමාර රාජපක්ෂ මැතිතුමා
14. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්.දුෂාන්ත ඉන්දික රත්දෙණිය මැතිතුමා
15. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ. චන්දක වීරසේන මැතිතුමා
16. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.කේ. ලලිත් පද්මසිරි විජය නන්ද මැතිතුමා
17. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්. උදයකුමාර් මැතිතුමා
18. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.පී. චිත්‍රා ජයසිංහ පතිරණ මැතිණිය
19. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්ලිව්.එම්.එම්.පී.ජමිත් මැතිතුමා
20. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්ලිව්. චාමලී තුෂාරිකා ප්‍රනාන්දු මැතිණිය
21. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ධනුෂ්ක තිලකසිරි මැතිතුමා
22. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එනස්ට් ඩෙන්සිල් ස්ලේඩන් මැතිතුමා
23. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්. චන්ද්‍රසේකර මැතිතුමා
24. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.එම්. කරුණාදාස මැතිතුමා
25. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එම්. චාමර ප්‍රසාද් ගුණසේකර මැතිතුමා
26. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.රාසීක් මැතිතුමා
27. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ. එම්. හුසෙයින් මැතිතුමා
28. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.පී.ඥානපාල සේනාධීර මැතිතුමා
29. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.එම්. ප්‍රේමරත්න මැතිතුමා
30. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්. දනිෂා මැතිණිය
31. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ. මුත්තුකුමාර් මැතිතුමා
32. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්. පත්මිණී දිසානායක මැතිණිය
33. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එම්. සිත්ති උසෙයිමා මැතිණිය
34. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්. වසන්ත කුමාරන් මැතිතුමා
35. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එච්. අබ්දුල් හසීම් මැතිතුමා
36. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. ජබාර් තුවාන්කාසිම් මැතිතුමා
37. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. සිසිර දිලාන් ජයතිලක මැතිතුමා
38. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඒ.ඩී. අමිත අමරසූරිය මැතිතුමා
39. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී. චූලනී ජයමාලි මැතිණිය
40. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එම්.ඉන්දික සේනාරත්න මැතිතුමා
41. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එම්.සෝමසිරි බණ්ඩාර මැතිතුමා
42. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එම්.ශාන්තා ප්‍රසාදි දේශානි මැතිණිය
43. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.එම්. කුසුමාවතී මැතිණිය

**නොපැමිණි**

01.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. තාහිර් මහාරූෆ් මැතිතුමා

**ගරු සභාපති ඩී.එම්. අජිත් කුමාර මැතිතුමා**

පසුගිය නොවැම්බර් මස 27 වන දින අපේ රටට බලපෑ දිට්වා කුණාටුව හේතුවෙන් අප රට විශාල වශයෙන් අපාදාවන්ට මුහුණ දීමට සිදු වුණා. මේ ස්වභාවික ආපදා තත්වය හේතුවෙන් අපේ රටේ පුද්ගල මරණ 843 ක් ද, අතුරුදහන්වීම් 183 ක් හා බදුල්ල දිස්ත්‍රික්කයේ පුද්ගල මරණ 90 ක් හා අතුරුදහන්වීම් 13 ක්ද වාර්තා වූ අතර වැලිමඩ බල ප්‍රදේශය ගත් විට පුද්ගල මරණ 12 ක් හා එක් අතුරුදහන් විමක් ද වශයෙන් වාර්තා විය. එසේම මෙම ආපදාවන්ට අප රට මුහුණ දුන්නාට පසුව අපේ රටේ ආදරණීය පුරවැසියන්ගේ දිවි බේරා ගැනිමට ගොස් නාවික හමුදාවේ සෙබළුන් 05ක් හා ගුවන් හමුදාවේ ගුවන් නියමුවරයෙකුගේ ද දිවි අපට අහිමි වුනා.ඒවගේම අප බල ප්‍රදේශයේ මාර්ග සංවර්ධන අධිකාරියේ සහෝදරයකුගේ ද දිවි අහිමි වූ අතර අද වන විටවත් එම සහෝදරයාගේ මෘත දේහය සොයා ගැනිමට නොහැකි වි ඇත.

එසේම සුනාමි ව්‍යසනය සිදු වි අද දිනට වසර 21 සපිරෙන අතර මෙම ව්‍යසනය හේතුවෙන් ද අප රටේ ආදරණීය පුරවැසියන් 35,000 ක්ද,අතුරුදහන්වීම් 5000 ක් පමණද වාර්තා වුණ අතරම විශාල වශයෙන් දේපල හානිද සිදු විය.එබැවින් දිට්වා සුලි කුණාටුව හා සුනාමි ව්‍යසනය හේතුවෙන් මියගිය හා අතුරුදහන් වූ පුරවැසියන් සිහි කිරිම සඳහා විනාඩියක නිශ්ශබ්දතාවයක් පල කරන ලෙස සියලු දෙනාගෙන් ඉල්ලා සිටිනවා.

**අ). පසුගිය මහ සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරිම .**

ගරු සභාපතිතුමා විසින් පසුගිය සභා වාර්තාව සංශෝධන ඇත්නම් ඉදිරිපත් කර සභා සම්මත කර ගන්නා ලෙස ඉල්ලා සිටින ලදි.

ඒ අනුව 2025.11.27 වන දින මහා සභා රැස්විම් වාර්තාව **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්.දූෂාන්ත ඉන්දික රන්දෙණිය මැතිතුමා හා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.චන්දක වීරසේන මැතිතුමාගේ** යෝජනා ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත විය.

**ආ). ගරු සභාපතිතුමා විසින් කරන ලද නිවේදන**

- ✓ **ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.ටි.මහාරූෆ් මැතිතුමා නිවාඩු බවට නිවේදනය කිරිම**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ටි.මහාරූෆ් මැතිතුමාගේ මාමණ්ඩිය මිය යාම හේතුවෙන් 2025.12.26 වන අද දින මහාසභා රැස්විමට සහභාගි විමට නොහැකි බව නිවේදනය කිරිම

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.සිසිර දිලාන් ජයතිලක මැතිතුමා පෙ.ව 9.10ට සභාවට පැමිණෙන ලදි.

**ඇ). ප්‍රාදේශීය සභාව අමතා එවන සන්දේශ/පැමිණිලි/පෙත්සම්/සන්නිවේදන ලිපි - නැත**

**ඈ). යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න - නැත.**

**ඉ). යථා පරිදි කල් දි ඇති යෝජනා**

**ගරු සභාපතිතුමාගේ යෝජනා**

**යෝජනා අංක 01**

**<u>බෝගහකුඹුර වෙළඳ සංකීර්ණයේ පිහිටි අංක 24 දරණ කඩය පැවරිම.</u>**

2025.12.09 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටුවෙහි අංක 02 දරණ නිර්දේශය පරිදි මෙම කඩය පැවරිම ඥාති සම්බන්ධතාවක් මත සිදු නොවන හෙයින් දැනට සභාව අනුමත කර ඇති රු.250,000.00 ක මුදල අය කර ගිවිසුමේ 26 වන වගන්තිය ප්‍රකාරව කැප්පෙටිපොල, කළුබුළුලන්ද, විහාරගොඩ යන ලිපිනයෙහි පදිංචිජා.හැ.අංක 786943701 V හිමි එච්.එම්.මල්කාන්ති මියහට මෙකි කඩ කාමරයේ බදු අයිතිය පවරා දිම සුදුසු බවට මම මෙම ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එනස්ට් ඩෙන්සිල් ස්ලේඩන් මැතිතුමා** විසින් ස්ථිර කරන ලදි.

ඒ අනුව මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසන ලද අතර ඒ සඳහා විරෝධතා මතු නොවූ බැවින් මෙකී යෝජනාව 2025.12.26 දින සභාවේදී ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 02**

**<u>2025.11.27 වන දින සිට සිදු වූ ආපදා තත්වය හේතුවෙන් වැලිමඩ නගරයේ රථ වාහන ගාල් කිරිමේ දි අය කරනු ලබන ගාස්තුව ගෙවීම සඳහා සහනයක් ලබා දිම</u>**

2025.12.09 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටුවෙහි අංක 11 දරණ නිර්දේශය පරිදි 2025.11.27 වන දින සිට සිදු වූ ආපදා තත්වය හේතුවෙන් 2025 නොවැම්බර් මස 27,28 හා 29 යන දිනවල රථ වාහන ගාල් කිරිමේ දි අප සභාවට දෛනිකව එම් රිසාඩ් මහතා විසින් ගෙවිය යුතු රු.8,400.00 ක බදු මුදල 1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතේ 182 වගන්තිය ප්‍රකාරව අයකර නොගැනිම හා කපා හැරිම සිදු කිරිම සුදුසු බවට මම මෙම ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්. සරත් කුමාර රාජපක්ෂ මැතිතුමා** විසින් ස්ථිර කරන ලදි.

ඒ අනුව මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසන ලද අතර ඒ සඳහා විරෝධතා මතු නොවූ බැවින් මෙකී යෝජනාව 2025.12.26 දින සභාවේදී ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 03**

**<u>ශ්‍රේෂ්ඨාධිකරණ නඩු අංක FR/259/2025 සඳහා පෙනි සිටින නිතිඥවරයා වෙනුවෙන් නිතීඥ ගාස්තු ගෙවීම් කිරිම</u>**

2025.12.09 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටුවෙහි අංක 20 දරණ නිර්දේශය පරිදි නුවර එළිය පාර , වැලිමඩ යන ස්ථානයේ පවත්වාගෙන යනු ලබන ශ්‍රී පාලි ආයුර්වේද වෙළඳසැලෙහි බලපත්‍ර අංක 1821 දරණ වෙළඳ බලපත්‍රය අවලංගු කිරිම සම්බන්ධව එහි හිමිකරු වන එන්.පි.එස්.වීරවර්ණ මහතා විසින් ඩී.එම්.අජිත් කුමාර .සභාපති,ප්‍රාදේශිය සභාව, වැලිමඩ යන අය තුන්වන වගඋත්තරකරු කරමින් ශිර්ෂගත නඩුව ගරු ශ්‍රේෂ්ඨාධිකරණයෙහි ගොනු කර ඇත.ඒ අනුව ශ්‍රේෂ්ඨාධිකරණ නඩු අංක FR/259/2025 සඳහා තුන්වන වගඋත්තර පාර්ශවකරු වෙනුවෙන් පෙනි සිටින නිතිඥවරයා සඳහා නිතිඥ ගාස්තු ගෙවීම් කිරිම සුදුසු බවට මම මෙම ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ඩබ්ලිව්. චාමලී තුෂාරිකා ප්‍රනාන්දු මැතිණිය** විසින් ස්ථිර කරන ලදි.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජේ.එම්.ඉන්දික සම්පත් මැතිතුමා**

ගරු සභාපතිතුමනි,එම වෙළඳ බලපත්‍රය අවලංගු කිරිමට හේතුව පැහැදිලි කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

**ගරු සභාපති ඩී.එම්.අජිත් කුමාර දිසානායක**

ගරු සම්පත් මන්ත්‍රීතුමනි,මෙම ස්ථානයේ පාසල් දරුවන් ඉලක්ක කරගනිමින් මදනමෝදක නමින් හැඳින්වෙන මත්ද්‍රව්‍ය විකුණන බවට ප්‍රදේශවාසින්,පොලිස් ස්ථානාධිපතිතුමන්,ප්‍රාදේශිය සම්බන්ධිකරණ කමිටුවෙන් හා වෙළඳ සංගමයෙන් විශාල වශයෙන් චෝදනා එල්ල වුනා.නමුත් මේ සම්බන්ධව කටයුතු කරන බලධාරින් අප නොවන බැවින්,අපට මැදිහත්වීම් කල නොහැක.මේ නිසා ප්‍රාදේශිය සම්බන්ධිකරණ කමිටු යෝජනා සම්මතයකට අනුව ආයුර්වේද කොමසාරිස්වරයාව මේ සම්බන්ධයෙන් දැනුවත් කරන ලදි. ඒ අනුව මේ සම්බන්ධයෙන් පරික්ෂණයක් සිදුකරන ලද අතර එහි දි ආයුර්වේද කොමසාරිස්වරයා කියා සිටියේ ඔවුන්ගේ නිර්දේශයන්ට අනුකුලව නොවන අයුරින් මෙම ව්‍යාපාරය පවත්වාගෙන යන බවයි. මේ නිසා කඩ කරන ලද නිර්දේශයකට බලපත්‍රයක් නිකුත් කිරිමට නොහැකි බැවින්,ආයුර්වේද කොමසාරිස්තුමියගේ නිර්දේශය පදනම් කර ගනිමින් අප සභාව විසින් නිකුත් කරන ලද වෙළඳ බලපත්‍රය අවලංගු කරන ලදි.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රි ජේ.එම්.ඉන්දික සම්පත් මැතිතුමා**

ගරු සභාපතිතුමනි, වෙළඳ බලපත්‍රයක් ඉල්ලුම් කරන විට ඉල්ලුම් කරන කාරණය සඳහන් කරනු ලබනවා.මෙහි දි එය සඳහන් කර තිබෙන්නට නෑ. ඒවගේම උසාවියේ නඩුවක් පවත්වාගෙන යනු ලැබුවත්, අදටත් මෙම ව්‍යාපාරය සිදු වනවා.මේ සම්බන්ධයෙන් සභාව පැත්තෙන් කටයුතු කරන්නේ කෙසේද යන්න දැන ගැනිමට අවශ්‍යයි.

**ගරු සභාපති ඩී.එම්.අජිත් කුමාර දිසානායක**

මෙහි පළමුවන නඩු වාරය ශ්‍රේෂ්ඨාධිකරණය විසින් කැඳවනු ලබුවත් මෙම නඩුව ආපදා තත්වය පැවති කාලය තුළ දි පැවති බැවින්,සභාවෙන් හා ආයුර්වේද කොමසාරිස්ගේ පැත්තතෙනුත් සහභාගිවමට නොහැකි විය.වෙළඳ බලපත්‍රය අවලංගු කර තිබියදිත්, මේවන විටත් මෙම ව්‍යාපාරය පවත්වාගෙන යන බවට ශ්‍රේෂ්ඨාධිකරණය හා පොලිසිය දැනුවත් කරලා තියෙනවා.එසේම දෙසැම්බර් මස 29 වන දින ප්‍රාදේශිය සම්බන්ධිකරණ කමිටුව පැවැත්වෙන අතර එදිනට මේ සම්බන්ධව කතා කිරිමට අපේක්ෂා කරනවා.තවද මෙකි ව්‍යාපාරය නතර කරන්න අපට නොහැකි අතර අපට බලපත්‍රය අහෝසි කිරිමට පමණක් හැකියාව පවතිනවා.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ප්‍රභාත් රවීන්ද්‍ර මැතිතුමා**

ගරු සභාපතිතුමනි,බලපත්‍ර ලබා ගැනිමේදි හේතු කාරනා සඳහන් කරලා තියෙනවාද යන්න පැහැදිලි කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

**ගරු සභාපති ඩී.එම්.අජිත් කුමාර දිසානායක**

ව්‍යාපාර කිරිම සඳහා බලපත්‍රයක් ඉල්ලුම් කරන විට නීති විරෝධි නොවන වෙළඳාම් සඳහා පමණක් බලපත්‍ර අප ලබා දෙන අතර මේ සම්බන්ධයෙන් ආදායම් පරික්ෂක මැදිහත් වී අපට ලබා දෙන නිර්දේශය මත ව්‍යාපාරය කරගෙන යනවාද යන්න පරික්ෂා කරනු ලබයි.නමුත් ඒ නිරික්ෂණ වලට වඩා වැඩි දෙයක් ආයුර්වේද කොමසාරිස් විසින් ලබා දි ඇති බැවින් ,එකි නිර්දේශ පදනම් කරගෙන වෙළඳ බලපත්‍රය අහෝසි කිරිමට අප විසින් කටයුතු කරනු ලැබුවා.

ඒ අනුව මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසන ලද අතර ඒ සඳහා විරෝධතා මතු නොවූ බැවින් මෙකී යෝජනාව 2025.12.26 දින සභාවේදී ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 04**

**<u>2025- 01 අංක දරණ පරිපූරක ඇස්තමේන්තුව අනුමත කිරිම්</u>**

2025.12.09 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටුවෙහි අංක 21 දරණ නිර්දේශය පරිදි රු.34,104,203.69 ක් වු 2025-01 අංක දරණ පරිපූරක ඇස්තමේන්තුව අනුමත කිරිම සුදුසු බවට මම මෙම ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.වි.නිලූකා කුසුම් කුමාරි මැතිනිය** විසින් ස්ථිර කරන ලදි.

**ගරු සභාපති ඩී.එම්.අජිත් කුමාර දිසානායක මැතිතුමා**

ගරු මන්ත්‍රිතුමනි,තුමියනි, 2025 වර්ෂයට අදාලව පළාත් සභා අරමුදල් හා විමධ්‍යගත අරමුදල් තුළින් ප්‍රාදේශිය සභාවට ලැබෙන මුදල් ප්‍රමාණය මත ඇස්තමේන්තු කර තිබුනේ රු.ලක්ෂ 50 ක මුදලක් පමණි.නමුත් සභාව පත් වුවාට පසුව සිදු කරන ලද මැදිහත්විමත් සමග අපට පළාත් සභා අරමුදල් හා විමධ්‍යගත අරමුදල් තුළින් කෝටි 03 කට වැඩි මුදලක් ලැබුණා.ඒ අනුව එම මුදල ගිණුම්ගත කිරිමේ අවශ්‍යතාවය මත මෙම පරිපූරක ඇස්තමේන්තුව ගෙන එන ලදි.එසේම ප්‍රාදේශිය සභා අරමුදල ට කිසිදු බලපෑමක් මේ තුළින් සිදු නොවේ.

ඒ අනුව මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසන ලද අතර ඒ සඳහා විරෝධතා මතු නොවූ බැවින් මෙකී යෝජනාව 2025.12.26 දින සභාවේදී ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 05**

**<u>2025 සැප්තැම්බර් මාසය සඳහා වක්කඩහින්න ජල යෝජනා ක්‍රමයට අදාළව බිල් කිරීම් කටයුතු සිදු නොකිරීම</u>**

2025.12.18 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටුවෙහි අංක 01 දරන නිර්දේශය පරිදි 2025 සැප්තැම්බර් මාසය සඳහා වක්කඩහින්න ජල යෝජනා ක්‍රමයට අදාළව ජල පාරිභෝගිකයින්ගෙන් සභාවට මාසිකව අයවිය යුතු ස්ථාවර ගාස්තුව වන රු.3,450.00 ක මුදල 1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතේ 182 වගන්තිය ප්‍රකාරව අයකර නොගැනිම හා කපා හැරීම් කිරීම සුදුසු බවට මම මෙම ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව **ගරු ප්‍රාදේශීය සභා කේ.එම්.චාමර ප්‍රසාද් මැතිතුමා** විසින් ස්ථිර කරන ලදි.

ඒ අනුව මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසන ලද අතර ඒ සඳහා විරෝධතා මතු නොවූ බැවින් මෙකී යෝජනාව 2025.12.26 දින සභාවේදී ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 06**

**<u>කරගස්වගුර වාර්ෂික බිම්කුලි ගිවිසුම සංශෝධනය කිරිම</u>**

2025.12.18 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටුවෙහි අංක 02 දරණ නිර්දේශය පරිදි "අවසර පත්‍රය දරන්නා විසින් ඉඩම හෝ ඉඩමෙහි කිසියම් කොටසක් පිලිබඳව භුක්තිය අන්‍යයකුට විකිණිම, පැවරිම හෝ අතුරු බදු දිම හෝ සභාවේ අවසරයක් නොමැතිව නොකල යුතුය "යන වගන්තිය නව ගිවිසුමේ 06 වන වගන්තිය ලෙස ඇතුළත් කරන ලද නව සංශෝධිත ගිවිසුම අනුමත කිරිම සුදුසු බවට මම මෙම ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එනස්ට් ඩෙන්සිල් ස්ලේඩන් මැතිතුමා** විසින් ස්ථිර කරන ලදි.

ඒ අනුව මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසන ලද අතර ඒ සඳහා විරෝධතා මතු නොවූ බැවින් මෙකී යෝජනාව 2025.12.26 දින සභාවේදී ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 07**

**<u>යල්පත්වෙල ප්‍රදීපා පෙර පාසල පවත්වන ස්ථානය පිළිබඳව තීරණය කිරිම</u>**

2025.12.18 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටුවෙහි අංක 05 දරණ නිර්දේශය පරිදි යල්පත්වෙල ප්‍රදීපා පෙර පාසල පවත්වන ස්ථානය පිළිබඳව තීරණය කිරිම සඳහා මෙම ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණී ජේ.පී.චිත්‍රා ජයසිංහ මැතිතුමා** විසින් ස්ථිර කරන ලදි.

පසුගිය ආපදා තතත්වය හේතුවෙන් යල්පත්වෙල ප්‍රදීපා පෙර පාසලේ පසුපස හා ඉදිරිපස ඇති වේල්ල නාය යෑමකට ලක් විම හේතුවෙන් පෙර පාසල එම ස්ථානයේ පැවැත්විම අවධානමකට ලක් වි ඇත.විශේෂයෙන් සෙල්ලම් මිදුල තියෙන්නේ ඉදිරිපස මිදුලේය.එම නිසා මෙම පෙර පාසල වෙනත් ස්ථානයකට ගෙන යා යුතුය.පෙර පාසල තිබෙන ස්ථානය අප ප්‍රාදේශීය සභාව සතු තැනක් නොවන බැවින්,සභාව ලෙස මැදිහත් වි ඒ අදාළ කටයුතු කිරිමට හා ඉදි කිරිම් කටයුතු අපට කිරිමට හැකියාවත් නැත.මේ නිසා මුදල් කමිටුවේදිත් අප සාකච්ඡා කලේ,පෙර පාසල තාවකාලිකව වෙනත් ස්ථානයකට ගෙන යා යුතු බවට හා සභාවට අයිති ස්ථානයක පෙර පාසල අළුතින් ඉදි කිරිමටයි.එසේම දැනට අප ස්ථාන කිහිපක් හඳුනා ගෙන තියෙනවා.පෙර පාසල තිබුන ස්ථානය ආසන්නයේ ඇති සමුපකාර ගොඩනැගිල්ලේ ඉඩ ප්‍රමාණයත් ඇති අතර මෙම සමුපකාර සමිතියෙන් අප මේවන විට පෙර පාසල පැවැත්විමට ඉල්ලිම් කර තියෙනවා.සමහර විට මේ සඳහා ගෙවිමක් කිරිමට සිදු වේවි.මෙය පළාත් පාලන ආයතනයේ කාර්ය භාරයක් වන බැවින්,අප ඉදිරියේ දි අදාළ සුදුසුම ස්ථානය සොයා බලා අදාළ මැදිහත්විම් සිදු කරමු.

ඒ අනුව මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසන ලද අතර ඒ සඳහා විරෝධතා මතු නොවූ බැවින් මෙකී යෝජනාව 2025.12.26 දින සභාවේදී ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 08**

**<u>කැප්පෙටිපොල විශේෂ ආර්ථික මධ්‍යස්ථානයට පිටවීමේ මාර්ග කොටස හා ප්‍රාදේශීය සභාවේ මාර්ගය කොටස පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට පැවරීම</u>**

2025.12.18 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටුවෙහි අංක 13 දරණ නිර්දේශය පරිදි කැප්පෙටිපොල විශේෂ ආර්ථික මධ්‍යස්ථායට පිටවීමේ මාර්ග කොටස හා ප්‍රාදේශීය සභාවේ මාර්ග කොටස පළාත් මාර්ග

සංවර්ධන අධිකාරියට පැවරීම ඵලදායි කටයුත්තක් වන බැවින්,ඉදිරි මහා සභා යෝජනා සම්මකට යටත්ව මෙකී මාර්ග පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට පැවරීම සුදුසු බවට මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එම්.කරුණාරත්න මැතිතුමා** විසින් ස්ථිර කරන ලදි.

ඒ අනුව මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසන ලද අතර ඒ සඳහා විරෝධතා මතු නොවූ බැවින් මෙකී යෝජනාව 2025.12.26 දින සභාවේදී ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 09**

**<u>කර්මාන්ත ඇස්තමේන්තු අනුමත කිරීම.</u>**

2025.12.18 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටුවෙහි අංක 14 දරණ නිර්දේශය පරිදි 2025 අයවැය යෝජනාවල සඳහන් වැලිමඩ නුවරඑළිය මාර්ගයේ සිට නුගතලාව දිවුරුම්ගම මාර්ගය සකස් කිරීම සඳහා සකස් කර ඇති රු.1,900,000.00 ක ඇස්තමේන්තුව පිළිගැනීමටත්, ඒ අනුව එකී කර්මාන්තය සිදු කරවා ගෙන සභා අරමුදලින් ගෙවීම් කිරීම සුදුසු බවටත් මම මෙම ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි නිලූකා කුසුම් කුමාරි මැතිනිය** විසින් ස්ථිර කරන ලදි.

ඒ අනුව මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසන ලද අතර ඒ සඳහා විරෝධතා මතු නොවූ බැවින් මෙකී යෝජනාව 2025.12.26 දින සභාවේදී ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි ජබාර් තුවාන් කාසීම් මැතිතුමා පෙ.ව 9.15 ට සභාවට පැමිණෙන ලදි.

**යෝජනා අංක 10.**

**<u>දිවිතොටවෙල ආදාහානාගාරයේ තීන්ත ආලේපනය කිරීම</u>**

2025.12.18 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටුවෙහි අංක 15 දරණ නිර්දේශය පරිදි දිවිතොටවෙල ආදාහානාගාරයේ තීන්ත ආලේපනය කිරීම සඳහා රු.489,702.00 ක ඇස්තමේන්තුව පිළිගැනීමටත්, ඒ අනුව එකී කර්මාන්තය සිදු කරවා ගෙන සභා අරමුදලින් ගෙවීම් කිරීම සුදුසු බවටත් මම මෙම ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ධනුෂ්ක තිලකසිරි මැතිතුමා** විසින් ස්ථිර කරන ලදි.

ඒ අනුව මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසන ලද අතර ඒ සඳහා විරෝධතා මතු නොවූ බැවින් මෙකී යෝජනාව 2025.12.26 දින සභාවේදී ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී තුවාන් කාසිම් මැතිතුමා පෙ.ව 9.20ට සභාවට පැමිණෙන ලදි

**යෝජනා අංක 11.**

**<u>2026 වර්ෂය සඳහා කමිටු පත් කිරිම</u>**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 12(2) වගන්තිය ප්‍රකාරව මෙතැන් සිට 2026.12.31 දින දක්වා බල පැවැත්වෙන පරිදි වැලිමඩ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් හා කටයුතු පවත්වාගෙන යාමේදී මහසභාව වෙත උපදෙස් හා සහායන් ලබා දීම වෙනුවෙන් මුදල් හා ප්‍රතිපත්ති සැකසීම සඳහා මුදල් හා ප්‍රතිපත්ති කමිටුවද නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුවද ,කර්මාන්ත හා සේවා කමිටුවද,පරිසර හා පහසුකම් කමිටුවද වශයෙන් කමිටු පත් කිරීම සුදුසු බවටත්,එකී කමිටු සඳහා සාමාජිකයින් ලෙස මෙම සභාවේ ගරු මන්ත්‍රීවරුන් සභාවේ එකඟතාවයට යටත්ව මෙම අවස්ථාවේ පත්කර ගැනීම සුදුසු බවටත්, මම මෙම ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්.මහේෂ් කෝසල මැතිතුමා** විසින් ස්ථිර කරන ලදි.

**ගරු සභාපති ඩී.එම්.අජිත් කුමාර දිසානායක මැතිතුමා**

ගරු මන්ත්‍රීවරුනි, සෑම මුදල් වර්ෂයක් සඳහාම මුදල් හා ප්‍රත්පත්ති කමිටුව,පරිසර හා සේවා කමිටුව ,නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුව හා කාර්මික හා සේවා කමිටුව වශයෙන් කමිටු හතරක් පත් කර ගත යුතු බැවින් මෙම වර්ෂයේ අවසන් සභා දිනය අද වන නිසා,2026 වර්ෂය සඳහා බල පැවැත්වෙන පරිදි මෙම කමිටු පත් කර ගත යුතු වේ.ඒ අනුව පසුගිය සභා වාරයේ දි මුදල් හා ප්‍රතිපත්ති කමිටුව සඳහා සමාජිකයින් 21 දෙනෙකු පත් කර ගනු ලැබුවත් 2026 වර්ෂයට මුදල් කමිටුව නියෝජනය කිරිම සඳහා සමාජිකයින් 17 දෙනෙකු පත් කිරිම සුදුසු බවට මා යෝජනා කර සිටිනවා.මෙහි දි සභාව බහුතරය නියෝජනය කරන ජාතික බලවේගය දේශපාලන පක්ෂයෙන් මන්ත්‍රිවරු හා සිවිල් සාමාජිකයින් 10 ක්ද, අනෙක් පක්ෂ නියෝජනය කරමින් 07 දෙනෙක්ද වශයෙන් පත් කර ගැනිම සුදුසුය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි ප්‍රභාත් රවීන්ද්‍ර මැතිතුමා**

ගරු සභාපතිතුමනි,ඔබතුමා විසින් මුදල් කමිටුව සඳහා සාමාජිකයින් 17 දෙනෙකුගෙන් යුතු කණ්ඩායමක් පත් කර ගත යුතු බවට යෝජනා කළා.පසුගිය සභා වාරයේදි මුදල් කමිටුව සඳහා සමාජිකයින් 21 ක් යෝජනා කරගනු ලැබු අතර එහි දි කමිටු යෝජනා කරන අවස්ථාවේ දි කමිටුවකට තුන් දෙනා වන පදනම මත 10 දෙනෙකු නියෝජනය වන පරිදි තෝරා පත් කර ගනු ලැබුවා.2026 වර්ෂය සඳහා සමඟි ජනබල වේගයෙන් එක් කමිටුවකට තුන් දෙනා බැගින් කමිටු 04 සඳහා පත් කිරිම සුදුසු බව අපේ අදහසයි. මේ කෙරෙහි ඔබතුමාගේ අවධානය යොමු කරන ලෙස මා ඉල්ලා සිටිනවා.එසේම 2025 වර්ෂයේ කමිටු සඳහා පත් කර ගත් ආකාරයටම නියෝජිතයින් පත් කර ගනිමු යන්න අපේ අදහසයි.නැතිනම් අපට අනෙතුක් පක්ෂ හා බලන විට විට අපේ පක්ෂයට ලොකු ආසධාරනණයක් වනවා.

**ගරු සභාපති ඩී.එම්.අජිත්කුමාර දිසානායක මැතිතුමා**

ගරු සභාපතිතුමනි ,ගරු සභාව නියෝජනය කරන මන්ත්‍රිවරුන් 44 දෙනා නියෝජනය වන පරිදි කාරක සභා පත් කර ගනු ලබන්නේ මහා සභාවේ කටයුතු සඳහා සහය ලබා ගැනිමේ අරමුණිනේය.පසුගිය කමිටු වල සිටි ආකාරයටම පත් කර ගැනිම සුදුසු බවට යෝජනා වුණා තමෙහි පිරිස වැඩි කර ගැනිමේ ගැටළුවක් නැත.මන්ත්‍රිවරු 21 කණ්ඩායමත් කියන්නේ මහා සභාව කැඳවනවා හා සමානයි.පසුගිය මාස 06ක කාලය ගත්විට නම් කරන ලද මන්ත්‍රිවරුන්ගෙන් සැලකිය යුතු මන්ත්‍රිවරු ප්‍රමාණයක් මෙම කමිටු සඳහා සම්බන්ධ වෙලා නෑ.එම නිසා මේ ආකාරයට නම් කර ගත්තද,ප්‍රායෝගික තත්වයට මුහුණ දිමේ දි පත් කරගන්නා ලද මන්ත්‍රිවරුන් සියලු දෙනාම සහභාගි නොවන නිසා මෙවැනි යෝජනාවක් ගෙන එනු ලැබුවා. එසේ නම් ඔබතුමන්ලාගේ පැත්තෙන් අදහස් දක්වලා කමිටු සංයුතිය වෙනස් කර ගනිමු.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි ප්‍රභාත් රවීන්ද්‍ර මැතිතුමා**

ගරු සභාපතිතුමනි ,අපි කමිටු හතර සඳහා සමගි ජන බලවේගයෙන් මන්ත්‍රිවරු තුන්දෙනෙකු පත් කිරිමට යෝජනා කර සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.එම්.ඉන්දික සම්පත් මැතිතුමා**

ගරු සභාපතිතුමා පැවසූ පරිදි කමිටුවලට මන්ත්‍රීවරුන් සහභාගි නොවන බව සත්‍යයි. නමුත් පක්ෂයෙන් කමිටුව නියෝජන සිදු කරන්නේ කවුදැයි අසන බැවින් මන්ත්‍රීවරුන් නම් කර ගැනිම සුදුසුය.

ඒ අනුව මුදල් හා ප්‍රතිපත්ති කමිටුව සඳහා පහත සඳහන් සාමාජිකයින් යෝජනා ස්ථිර කරන ලදි.

| අ.අ | **පත් කර ගන්නා ලද ගරු මන්ත්‍රීවරයාගේ නම** | **යෝජනා කිරිම** | **ස්ථිර කිරිම** |
|---|---|---|---|
| 01. | ගරු සභාපති ඩී.එම්.අජිත් කුමාර දිසානායක මැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්.මහේෂ් කෝසල මැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ධනුෂ්ක තිලකසිරි මැතිතුමා |
| 02. | ගරු උප සභාපති එම්.එල්.එම්.සෆ්වාන් මැතිතුමා | | |
| 03. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එම්.කරුණාරත්න මැතිතුමා | | |
| 04. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.පී.ඥාණපාල සේනාධිර මැතිතුමා | | |
| 05. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි එච්.වි.නිලූකා කුසුම් කුමාරි මැතිනිය | | |
| 06. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණී ඩබ්.සී.තුෂාරිකා ප්‍රනාන්දු මැතිනිය | | |
| 07. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ධනුෂ්ක තිලකසිරි මැතිතුමා | | |
| 08. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්.මහේෂ් කෝසල රාජ කරුණා මැතිතුමා | | |
| 09 | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.චන්දක වීරසේන මැතිතුමා | | |
| 10. | රින්ෂාන් පුලයිලුන් මයා (සිවිල් නියෝජිත) | | |
| 11 | හේවගේ මයා (සිවිල් නියෝජිත) | | |
| 12. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ජේ.පී. චිත්‍රා පතිරණ ජයසිංහ මැතිණිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ධනුෂ්ක තිලකසිරි මැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.වි.නිලූකා කුසුම් කුමාරි මැතිනිය |
| 13 | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රභාත් රවින්ද්‍ර මැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එම්.ශාන්තා ප්‍රසාදි දේශානි මැතිණිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රභාත් රවින්ද්‍ර මැතිතුමා |
| 14 | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එම්.දයාරත්න මැතිතුමා | | |
| 15. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.ඒ.ප්‍රියන්ත චාමින්ද මැතිතුමා | | |
| 16. | ඒ.එම්.විමලසේන මයා(සිවිල් නියෝජිත) | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රභාත් රවින්ද්‍ර මැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.එම්. කුසුමාවතී මැතිණිය |
| 17. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.පත්මිනි දිසානායක මැතිණිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.එම්.ඉන්දික සම්පත් මැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සිත්ති උසෙයිමා මැතිනිය |
| 18. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.සිසිර දිලාන් ජයතිලක මැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනිබී.චූලනිජයමාලි බෝපගේ මැතිනිය | ගරුප්‍රාදේශීයසභා මන්ත්‍රීඒ.ඒ.ඩී.අමිතඅමරසූරිය මැතිතුමා |
| 19. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එච්.ඒ.හාසීම් මැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වසන්ත කුමාරන් මැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජබාර්තුවාන්කාසීම්මැතිතුමා |
| 20. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.මුත්තුකුමාර් මැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඉන්දිකසේනාරත්නමැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී තුවාන් කාසිම් මැතිතුමා |
| 21. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ටි.මහාරූෆ් මැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී තුවාන් කාසීම් මැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එච්.ඒ හාසීම් මැතිතුමා |
| 22. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එම්.ඉන්දික සේනාරත්න මැතිතුමා | ගරුප්‍රාදේශීය සභාමන්ත්‍රී බී.චූලනි ජයමාලි බෝපගේ මැතිනිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඒ.ඩී.අමිතඅමරසූරිය මැතිතුමා |

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රභාත් රවීන්ද්‍ර මැතිතුමා**

ගරු සභාපතිතුමනි,අපේ පක්ෂයේ මන්ත්‍රීවරුන් මෙම සභාවට පත් වෙලා පැමිණියේ කමිටු පත් කළාට පසුව බැවින් අපේ පැත්තෙන් කමිටු සංශෝධනය කළයුතුය.

**ගරු සභාපති ඩී.එම්.අජිත් කුමාර මැතිතුමා,**

ගරු මන්ත්‍රීතුමනි, සෑම කමිටුවක් සඳහාම ඔබ පක්ෂයෙන් මන්ත්‍රීවරුන් දෙදෙනෙකු බැගින් නම් කර දෙන ලෙස ඉල්ලා සිටින අතර මේ කමිටුවල දැනට සිටින මන්ත්‍රීවරුන් එහි ඇති ප්‍රශ්න හඳුනාගෙන ඇති බැවින් ඔබතුමන්ලාගේ පක්ෂයේ සංශෝධන පමණක් ඇතුළත් කර අනෙකුත් සාමාජිකයින් එලෙසම තබා ගන්නා ලෙස මා ඉල්ලා සිටිනවා.

සමගි ජනබල වේගය පක්ෂයෙන් කමිටු සඳහා පහත මන්ත්‍රීවරුන් පරිදි යෝජනා ස්ථිර කරන ලදි.

| අ.අ | කමිටුවේ නම | පත්කරන ලද මන්ත්‍රීවරයාගේ නම | යෝජනා කරන ලද්දේ | ස්ථිර කරන ලද්දේ |
|---|---|---|---|---|
| 1 | පරිසර හා සේවා කමිටුව | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි එච්.එම්.ශාන්තා ප්‍රසාදි දේශානි මැතිණිය.<br>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.එම් අජිත් ප්‍රේමලාල් මැතිතුමා. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි ප්‍රභාත් රවින්ද්‍ර මැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිඑම්.එම්.දයාරත්න මැතිතුමා |
| 2 | නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුව | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි චන්ද්‍රිකා තෙන්නකෝන් මැතිණිය,<br>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි ඩබ්.එම්. කුසුමාවතී මැතිණිය, | | |
| 3 | කර්මාන්ත හා සේවා කමිටුව | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි සෝමසිරි බණ්ඩාර මැතිතුමා.<br>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි එස් දනීෂා මැතිණිය,<br>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි එම්.එච්.එම්.ෆායිස් සායිබු මැතිතුමා. | | |

ඒ අනුව 2026 වර්ෂයේ පරිසර හා සේවා කමිටුව, නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුව හා කර්මාන්ත හා සේවා කමිටුව යන කමිටු සඳහා මන්ත්‍රීවරුන් පහත පරිදි වේ.

| අ.අ | කමිටුවේ නම | මන්ත්‍රීවරයාගේ නම |
|---|---|---|
| 01 | නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුව | 1.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි එස්. උදයකුමාර් මැතිතුමා |
| | | 2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි ඩී.පී.ඥානපාල සේනාධීර මැතිතුමා |
| | | 3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි ආර්.එම්. සරත් කුමාර රාජපක්ෂ මැතිතුමා |
| | | 4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි එස්.එම්.රාසීක් මැතිතුමා |
| | | 5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි ඩබ්ලිව්.එම්.එම්.පී.ජමිත් මැතිතුමා |
| | | 6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි එච්.එම්. සිත්ති උසෙයිමා මැතිණිය |
| | | 7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි ජේ.පී. චිත්‍රා ජයසිංහ පතිරණ මැතිණිය |
| | | 8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි ආර්. වසන්ත කුමාරන් මැතිතුමා |

| | | |
|---|---|---|
| | | 9. ඒ.ඒ.ඩී. අමිත අමරසූරිය මැතිතුමා |
| | | 10.එම්.අබේරත්න මයා ( සිවිල් සාමාජික) |
| | | 11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.චන්ද්‍රිකා තෙන්නකෝන් මැතිණිය |
| | | 12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.එම්.කුසුමාවතී මැතිණිය |
| | | 13. එම්.සමරනායක මයා ( සිවිල් සාමාජික) |
| 02 | පරිසර හා සේවා කමිටුව | **1**.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්.මහේෂ් කෝසල මැතිතුමා |
| | | 2.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එම්.චාමර ප්‍රසාද් මැතිතුමා |
| | | **3**.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.ඩෙන්සිල් ස්ලේඩන් මතිතුමා |
| | | **4**.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.හුසෙයින් මැතිතුමා |
| | | **5**.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්ලිව්. චාමලී තුෂාරිකා ප්‍රනාන්දු මැතිණිය |
| | | **6**.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එම්.කරුණාරත්න මැතිතුමා |
| | | **7**.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. තාහිර් මහරූෆ් මැතිතුමා |
| | | **8**.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. සිසිර දිලාන් ජයතිලක මැතිතුමා |
| | | **9**.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එම්.ශාන්තා ප්‍රසාදි දේශානි මැතිණිය |
| | | **10**.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.එම්.අජිත් ප්‍රේමලාල් මැතිතුමා |
| | | **11**.ඩී ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී.එම්.පද්මිණී දිසානායක මැතිණිය |
| | | **12**.එම්.සමන්ත පුෂ්පකුමාර මයා ( සිවිල් සාමාජික) |
| | | 13.අමරකෝන් මන්ත්‍රී මයා ( සිවිල් සාමාජික) |
| 03 | කර්මාන්ත හා සේවා කමිටුව | **1**.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්.දූෂාන්ත ඉන්දික රත්නායක මැතිතුමා |
| | | **2**.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.එම්. ප්‍රේමරත්න මැතිතුමා |
| | | **3**.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.වී.එන්.කුසුම් කුමාරි මැතිණිය |
| | | **4**.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.එම්. කරුණාදාස මැතිතුමා |
| | | **5**.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.කේ. ලලිත් පද්මසිරි විජය නන්ද මැතිතුමා |
| | | **6**.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්. චන්ද්‍රසේකර මැතිතුමා |
| | | **7**.ඩී ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී.එම්.පද්මිණී දිසානායක මැතිණිය |
| | | **8**.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජබාර් තුවාන් කාසිම් මැතිතුමා |
| | | **9**.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එම්.සෝමසිරි බණ්ඩාර මැතිතුමා |
| | | **10**.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස් දනීෂා මැතිණිය |
| | | **11**.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එච්.එම්.ෆායිසු සයිබු මැතිතුමා |
| | | **12**.බී ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී චූලනී ජයමාලි බෝපගේ මැතිණිය |
| | | |
| | | **13**.එම්.විමල් වීර වික්‍රම මයා ( සිවිල් සාමාජික) |
| | | **14**.එම්.කේ.සී රත්නායක මයා ( සිවිල් සාමාජික) |

ඒ අනුව මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසන ලද අතර ඒ සඳහා විරෝධතා මතු නොවූ බැවින් මෙකී යෝජනාව 2025.12.26 සභාවේදී ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 12**

<u>කාරක සභා බලතල පැවරීම</u>

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 12(1) වගන්තිය ප්‍රකාරව කාරක සභා බලතල පැවරීම යටතේ වැලිමඩ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් හා කර්තව්‍යයන් ඉටු කිරීමේදී සැපයුම් හා සේවා ලබා ගැනීම හා ඒ සඳහා යන වියදම් දැරීමේ බලය මුදල් හා ප්‍රතිපත්ති කමිටුව වෙත පැවරීම සුදුසු බවටත්, එහිදී සභාවේ එකගතාවයට යටත්ව එම වියදම් සීමාව තීරණය කිරීමේ බලය මහ සභාව වෙත පැවරීම සුදුසු බවටත් මම මෙම ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු උපසභාපති එම්.එල්.එම්. සෆ්වාන් මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඉන්දික සම්පත් මැතිතුමා,**

ගරු සභාපතිතුමනි,මෙම යෝජනාවේ" සීමා කිරීමේ බලය" යනුවෙන් සඳහන් කිරීම අපහැදිලි බැවින් එය පැහැදිලි කරන ලෙස ඉල්ලා සිටිනවා.

**ගරු සභාපති අජිත් කුමාර දිසානායක මැතිතුමා.**

මන්ත්‍රීතුමනි අපි සභාව කාරක සභාවක් බවට පත් කරගෙන අවශ්‍ය පැහැදිලි කිරීම් සිදු කර ගනිමු.

මහ සභාව කාරක සභා අවස්ථාවක් බවට පත්කිරීමට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දයාරත්න මැතිතුමා විසින් යෝජනා කරන ලද අතර ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රියන්ත චාමින්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

කාරක සභාව මහ සභාව බවට පත්කිරීම සඳහා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රභාත් රවීන්ද්‍ර මැතිතුමා විසින් යෝජනා කරන ලද අතර ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඉන්දික සම්පත් මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රභාත් රවීන්ද්‍ර මැතිතුමා**

ගරු සභාපතිතුමනි, 2011,2018 යන වර්ෂවල පැවති සභාවන්හිදි ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරුන් ලෙස ඔබතුමන්ලා විසින් මුදල් කමිටුවට සහභාගි නොවූයේ මුදල් කමිටුව සඳහා නිර්දේශ කිරීමේ බලය පමණක් ලබා දුන් බැවිනි. එම නිසා මෙම යෝජනාව තුළ මුදල් කමිටුවට බලය පැවරීමේදී නිර්දේශ කිරීමේ බලය පමණක් ලබා දීමටත් ,අනෙකුත් සියලු බලතල මහ සභාවට ලබා දීමටත්,සුදුසු බව මා යෝජනා කර සිටිනවා.

ඒ අනුව එම යෝජනාව ගරු මන්ත්‍රී ඉන්දික සම්පත් මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

**ගරු සභාපති ඩී.එම්.අජිත් කුමාර දිසානායක මැතිතුමා**

න්‍යාය පත්‍රයේ සඳහන් කර ඇති වැලිමඩ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් හා කර්තව්‍යයන් ඉටු කිරීමේදී සැපයුම් හා සේවා ලබා ගැනීම හා ඒ සඳහා යන වියදම් දැරීමේ බලය මුදල් හා ප්‍රතිපත්ති කමිටුව වෙත පැවරීම සුදුසු බවට වූ යෝජනාව පක්ෂ ලෙසද රවීන්ද්‍ර මන්ත්‍රීතුමා විසින් ගෙනා ආ මුදල් කමිටුවට බලය පැවරීමේදී නිර්දේශ කිරීමේ බලය පමණක් ලබා දීම සුදුසු බවට වූ යෝජනාව විපක්ෂ ලෙසද ගෙන ඡන්ද විමසීම සිදු කරන ලෙස ලේකම්තුමාගෙන් ඉල්ලා සිටිනවා.

ඒ අනුව පහත සඳහන් පරිදි ලේකම්තුමා විසින් ඡන්දය සටහන් කරගන්නා ලදි.

| අ.අ | නම | පක්ෂ | විපක්ෂ | නොපැමිණි | ඡන්දය ප්‍රකාශ කිරීමෙන්වැළකී සිටි |
|---|---|---|---|---|---|
| 1 | ගරු සභාපති ඩී.එම්.අජිත් කුමාර දිසානායක මයා | ✓ | | | |
| 2 | ගරු සභාපති එම්.එල්.එම්.සෆ්වාන් මයා | ✓ | | | |
| 3 | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.එම්.ඉන්දික සම්පත් මයා | | ✓ | | |
| 4 | ගරු ප්‍රාදේශීය සභාමන්ත්‍රීඑල්.එම්.ප්‍රභාත්රවීන්ද්‍රගුණසේකරමයා | | ✓ | | |
| 5 | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එම්.කරුණාරත්න හේරත් මයා | ✓ | | | |
| 6 | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එම්.දයාරත්න මයා | | ✓ | | |
| 7 | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.වී.නිලූකා කුසුම් කුමාරි මිය | ✓ | | | |
| 8 | මොහොමඩ් අලීම් මොහොමඩ් ෆායිස් සයිබු මයා | | ✓ | | |
| 9 | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.එම්.අජිත් ප්‍රේමලාල් මයා | | ✓ | | |
| 10 | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.චන්ද්‍රිකා තෙන්නකෝන් මිය | | ✓ | | |
| 11 | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.ඒ.ප්‍රියන්ත චාමින්ද මයා | | ✓ | | |
| 12 | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්.මහේෂ් කෝසල මයා | ✓ | | | |
| 13 | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්.සරත් කුමාර රාජපක්ෂ මයා | ✓ | | | |
| 14 | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්.ඩී.අයි.රන්දෙනිය මයා | ✓ | | | |
| 15 | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.චන්දක වීරසේන මයා | ✓ | | | |
| 16 | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.කේ ලලිත් පදිමසිරි මයා | ✓ | | | |
| 17 | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.උදයකුමාර් මයා | ✓ | | | |
| 18 | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.පී.චිත්‍රා ජයසිංහ පතිරණ මිය | ✓ | | | |
| 19 | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එම්.පී.ජමිත් මයා | ✓ | | | |
| 20 | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.සී.තුෂාරිකා ප්‍රනාන්දු මිය | ✓ | | | |
| 21 | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී.. ජී ධනුෂ්ක තිලකසිරි මයා | ✓ | | | |
| 22 | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.ඩෙන්සිල්.ස්ලේඩන් මයා | ✓ | | | |
| 23 | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්.චන්ද්‍රසේකර මයා | ✓ | | | |
| 24 | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.එම්.කරුණාදාස මයා | ✓ | | | |
| 25 | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එම්.චාමර ප්‍රසාද් ගුණසේකර මයා | ✓ | | | |
| 26 | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.රාසික් මයා | ✓ | | | |
| 27 | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.හුසෙයින් මයා | ✓ | | | |
| 28 | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ඩී.ජී.සේනාධිර මයා | ✓ | | | |
| 29 | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.එම්.ප්‍රේමරත්න මයා | ✓ | | | |
| 30 | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.දනීෂා මිය | | ✓ | | |
| 31 | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.මුත්තුකුමාර් මයා | | ✓ | | |
| 32 | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.පත්මිණි දිසානායක මිය | | ✓ | | |
| 33 | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එම්.සිත්ති හුසෙයිමා මිය | | ✓ | | |
| 34 | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.වසන්ත කුමාරන් මයා | | ✓ | | |
| 35 | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එච්.ඒ.හාසීම් මයා | | ✓ | | |
| 36 | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ටී.මහාරුෆ් මයා | | | ✓ | |
| 37 | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ජේ.තුවාන් කාසිම් මයා | | | | ✓ |
| 38 | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එස්.දිලාන් ජයතිලක මයා | | ✓ | | |
| 39 | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඒ.ඩී.අමිත අමරසූරිය මයා | | ✓ | | |
| 40 | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජයමාලි බොපගේ මිය | | ✓ | | |
| 41 | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එම්.ඉන්දික සේනාරත්න මයා | | ✓ | | |
| 42 | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එම්.සෝමසිරි බණ්ඩාර මයා | | ✓ | | |
| 43 | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එම්.ශාන්තා ප්‍රසාදි දේශානි මිය | | ✓ | | |
| 44 | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.එම්. කුසුමාවතී මිය | | ✓ | | |
| | එකතුව | 22 | 20 | 01 | 01 |

ඒ අනුව මෙම යෝජනාවට පක්ෂව ඡන්ද 22ක්ද විපක්ෂව ඡන්ද 20ක්ද නොපැමිණි ගණන 01ක්ද ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැලකී සිටි ගණන 01ක්ද වශයෙන් සභිකයින් විසින් ඡන්දය ප්‍රකාශ කරන ලද අතර වැඩි ඡන්ද සංඛ්‍යාව 02 කින් මෙකී යෝජනාව 2025.12.26 දින සභාවේදී බහුතර ඡන්දයෙන් සභා සම්මත විය.

**යෝජනා අංක 13**

<u>වියදම් දැරීමේදී සීමාව</u>

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 12(1) වගන්තිය ප්‍රකාරව වැලිමඩ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් හා කටයුතු පවත්වාගෙන යාම සඳහා වන වියදම් දැරීමේදී රු.5000.00 සිට යම් සීමාවක් දක්වා මුදල් හා ප්‍රතිපත්ති කමිටුවේ ආවරණ අනුමැතියට යටත්ව වියදම් ක්‍රමවේදයක් ඇති කිරීම සුදුසු බවට මම අදහස් කරමි.එම ආයතන කටයුතු කාර්යක්ෂම හා කඩිනම් කිරීමේදී ඉවහල් වනු ඇත.එබැවින් ගරු සභාව විසින් තීරණය කරනු ලබන සීමාවකට යටත්ව මුදල් හා ප්‍රසම්පාදන කමිටුවේ ආවරණ අනුමැතියට යටත් ගෙවීම් සීමාවක් ඇති කිරීම සුදුසු බවට මම මෙම ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.පී.ඥාණපාල සේනාධිර මැතිතුමා** විසින් ස්ථිර කරන ලදි.

වැලිමඩ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් හා කටයුතු පවත්වාගෙන යාම සඳහා වන වියදම් දැරීමේදී සීමාව සඳහා ලක්ෂ පහක මුදල සුදුසු යැයි **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.පී.ඥාණපාල සේනාධිර මැතිතුමා** විසින් යෝජනා කරන ලදි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.ධනුෂ්ක තිලකසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඉන්දික සම්පත් මැතිතුමා**

ගරු සභාපතිතුමනි, මෙම යෝජනාවට මාගේ විරුද්ධතාවය ප්‍රකාශ කර සිටිනවා.

ප්‍රාදේශීය සභා රීති අනුව රු.5000.00 සීමාවක් ඇති බැවින් වියදම් දැරීමේ සීමාව රු.5000.00ක මුදල සුදුසු බවට **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.ඒ.ප්‍රභාත් රවීන්ද්‍ර ගුණසේකර මැතිතුමා** විසින් යෝජනා කරන ලදි.

එම යෝජනාව ප්‍රියන්ත චාමින්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

**ගරු සභාපති ඩී.එම්.අජිත් කුමාර දිසානායක මැතිතුමා**

වැලිමඩ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් හා කටයුතු පවත්වාගෙන යාම සඳහා වන වියදම් දැරීමේදී සීමාව සඳහා යෝජනා දෙකක් ඉදිරිපත් වී ඇති බැවින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඥාණපාල සේනාධිර මැතිතුමා විසින් ගෙන එන ලද යෝජනාව පක්ෂ ලෙසද ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.එම්.ප්‍රභාත් රවීන්ද්‍ර ගුණසේකර මැතිතුමා විසින් ගෙන එන ලද යෝජනාව විපක්ෂ ලෙසද ගෙන ඡන්ද විමසීම සිදු කරන ලෙස ලේකම්තුමාගෙන් ඉල්ලා සිටිනවා.

ඒ අනුව පහත සඳහන් පරිදි ලේකම්තුමා විසින් ඡන්දය සටහන් කරගන්නා ලදි.

| අ.අ | නම | පක්ෂ | විපක්ෂ | නොපැමිණි | ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටි |
|---|---|---|---|---|---|
| 1 | ගරු සභාපති ඩී.එම්.අජිත් කුමාර දිසානායක මයා | ✓ | | | |
| 2 | ගරු උප සභාපති එම්.එල්.එම්.සෆ්වාන් මයා | ✓ | | | |
| 3 | ජේ.එම්.ඉන්දික සම්පත් මයා | | ✓ | | |
| 4 | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.එම්.ප්‍රභාත් රවීන්ද්‍ර ගුණසේකරමයා | | ✓ | | |
| 5 | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එම්.කරුණාරත්න හේරත් මයා | ✓ | | | |
| 6 | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එම්.දයාරත්න මයා | | ✓ | | |
| 7 | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.වි.නිලූකා කුසුම් කුමාරි මිය | ✓ | | | |
| 8 | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මොහොමඩ් අලීම් මොහොමඩ් ෆායිස් සයිබු මයා | | ✓ | | |
| 9 | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.එම්.අජිත් ප්‍රේමලාල් මයා | | ✓ | | |
| 10 | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.චන්ද්‍රිකා තෙන්නකෝන් මිය | | ✓ | | |
| 11 | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.ඒ.ප්‍රියන්ත චාමින්ද මයා | | ✓ | | |
| 12 | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්.මහේෂ් කෝසල රාජකරුණා මයා | ✓ | | | |
| 13 | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්.සරත් කුමාර රාජපක්ෂ මයා | ✓ | | | |
| 14 | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්.ඩී.අයි.රන්දෙනිය මයා | ✓ | | | |
| 15 | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.චන්දක වීරසේන මයා | ✓ | | | |
| 16 | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.කේ ලලිත් පදිමසිරි විජයනන්ද මයා | ✓ | | | |
| 17 | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.උදයකුමාර් මයා | ✓ | | | |
| 18 | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.පි.චිත්‍රා ජයසිංහ පතිරණ මිය | ✓ | | | |
| 19 | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එම්.පි.ජමිත් මයා | ✓ | | | |
| 20 | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.සි.තුෂාරිකා ප්‍රනාන්දු මිය | ✓ | | | |
| 21 | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී..ධනුෂ්ක තිලකසිරි මයා | ✓ | | | |
| 22 | ඊ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී.ඩෙන්සිල්.ස්ලේඩන් මයා | ✓ | | | |
| 23 | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්.චන්ද්‍රසේකර මයා | ✓ | | | |
| 24 | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.එම්.කරුණාදාස මයා | ✓ | | | |
| 25 | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එම්.චාමර ප්‍රසාද් ගුණසේකර මයා | ✓ | | | |
| 26 | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.රාසික් මයා | ✓ | | | |
| 27 | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.හුසෙයින් මයා | ✓ | | | |
| 28 | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ඩී.ජී.සේනාධිර මයා | ✓ | | | |
| 29 | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.එම්.ප්‍රේමරත්න මයා | ✓ | | | |
| 30 | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.දනීෂා මිය | | ✓ | | |
| 31 | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.මුත්තුකුමාර් මයා | | ✓ | | |
| 32 | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.පත්මිණි දිසානායක මිය | | ✓ | | |
| 33 | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එම්.සිත්ති හුසෙයිමා මිය | | ✓ | | |
| 34 | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.වසන්ත කුමාරන් මයා | | ✓ | | |
| 35 | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එච්.ඒ.හාසීම් මයා | | ✓ | | |
| 36 | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ටි.මහාරූෆ් මයා | | | ✓ | |
| 37 | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ජේ.තුවාන් කාසිම් මයා | | ✓ | | |
| 38 | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එස්.දිලාන් ජයතිලක මයා | | ✓ | | |
| 39 | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඒ.ඩී.අමිත අමරසූරිය මයා | | ✓ | | |
| 40 | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජයමාලි බොපගේ මිය | | ✓ | | |
| 41 | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එම්.ඉන්දික සේනාරත්න මයා | | ✓ | | |
| 42 | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එම්.සෝමසිරි බණ්ඩාර මයා | | ✓ | | |
| 43 | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එම්.ශාන්තා ප්‍රසාදි දේශානි මිය | | ✓ | | |
| 44 | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.එම්. කුසුමාවතී මිය | | ✓ | | |
| | එකතුව | 22 | 21 | 1 | |

ඒ අනුව මෙම යෝජනාවට පක්ෂව ඡන්ද 22ක්ද විපක්ෂව ඡන්ද 21ක්ද නොපැමිණි ගණන 01ක්ද ,වශයෙන් සභිකයින් විසින් ඡන්දය ප්‍රකාශ කරන ලද අතර එහිදී වැඩි ඡන්ද සංඛ්‍යාව 01 කින් මෙකී යෝජනාව 2025.11.26 දින සභාවේදී බහුතර ඡන්දයෙන් සභා සම්මත විය.

**යෝජනා අංක 14**

**2025 දෙසැම්බර් මස සභා දීමනාව ගෙවීම**

වැලිමඩ ප්‍රාදේශීය සභාවේ ගරු සභාපති, උප සභාපති හා ගරු මන්ත්‍රීතුමන්ලා ,තුමියන්ලා හට 2025 දෙසැම්බර් මස මන්ත්‍රී දීමනා වශයෙන් රු.675,000.00ක මුදලක් ප්‍රතිපූර්ණයට යටත්ව සභා අරමුදලින් දැරීමට සුදුසු බවට මම මෙම ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්. සරත් කුමාර රාජපක්ෂ මැතිතුමා** විසින් ස්ථිර කරන ලදි.

ඒ අනුව මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසන ලද අතර ඒ සඳහා විරෝධතා මතු නොවූ බැවින් මෙකී යෝජනාව 2025.12.26 දින සභාවේදී ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 15**

**2025 දෙසැම්බර් මස දෛනික වැටුප් ගෙවීම**

වැලිමඩ ප්‍රාදේශීය සභාවේ දෛනික සේවයේ නිරත සේවක මහත්ම මහත්මීන් 36 දෙනෙක් සඳහා 2025 දෙසැම්බර් මස දෛනික වැටුප් වශයෙන් රු.2,220,992.50ක මුදලක් සභා අරමුදලින් දැරීමට සුදුසු බවට මම මෙම ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී .එම්. චාමර ප්‍රසාද් ගුණසේකර මැතිතුමා** විසින් ස්ථිර කරන ලදි.

ඒ අනුව මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසන ලද අතර ඒ සඳහා විරෝධතා මතු නොවූ බැවින් මෙකී යෝජනාව 2025.12.26 දින සභාවේදී ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 16**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රියන්ත ලියනාරච්චි මැතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනාව**

**ගරු සභාපති ඩී.එම්.අජිත් කුමාර දිසානායක මැතිතුමා,**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රියන්ත ලියනාරච්චි මැතිතුමා විසින් එම යෝජනාව ඉදිරිපත් කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රියන්ත ලියනාරච්චි මැතිතුමා**

ගරු සභාපතිතුමනි,ඒ සඳහා අවස්ථාව ලැබුණු බැවින් එම යෝජනාව ඉදිරිපත් කිරිමට අවශ්‍ය නොවන බව මා පවසන අතර ඒ සඳහා අවස්ථාව ලබා දීම පිළිබඳව මා ස්තූතිය පුද කර සිටිනවා.

**ඊ).කාරක සභා වාර්තා සලකා බැලිම.**

ගරු ප්‍රාදේශිය සභා සභාපති ඩි.එම්.අජිත් කුමාර මැතිතුමා විසින් සංශෝධන ඇත්නම් ඉදිරිපත් කරන ලෙස පවසා සිටින ලදි.

ඒ අනුව,

1. 2025.12.09 වන දින මුදල් හා ප්‍රතිපත්ති කමිටු වාර්තාව
2. 2025.12.18 වන දින මුදල් හා ප්‍රතිපත්ති කමිටු වාර්තාව

**ගරු සභාපති ඩී.එම්.අජිත් කුමාර දිසානායක මැතිතුමා**

2025.12.18 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටු වාර්තාවේ අංක 08 යටතේ ඇති ලිපියේ නිර්දේශය ලෙස සඳහන් කර ඇත්තේ පොළ භූමියේ ආපන ශාලාව රු.400,000.00 ක වාර්ෂික බදු මුදලකට යටත්ව හෙලවෙල ,ඇල්ල පාර, වැලිමඩ යන ලිපිනයෙහි පදිංචි ජී.එච්.සුගත් මහතාහට ලබා දිම සුදුසු බවටයි.

නමුත් එකි නිර්දේශය පහත ආකාරයට සංශෝධනය විය යුතුය.

2026 වර්ෂය සඳහා පොළ භූමියේ ආපනශාලා ටෙන්ඩර් කල නමුත් ගැණුම්කරුවන් ඉදිරිපත් නොවූ බැවින්, 2025 වර්ෂයේ දී ආපන ශාලාව සඳහා අයකල පරිදිම 2026 වර්ෂයේ දිද සතිපොල පැවැත්වෙන සෑම දිනයක් සඳහාම රු.2,000.00 ක මුදලකට යටත්ව හෙලවෙල ,ඇල්ල පාර, වැලිමඩ යන ලිපිනයෙහි පදිංචි ජී.එච්.සුගත් මහතාහට ලබා දිම සුදුසු බවයි.

ඉහත සඳහන් කාරක සභා වාර්තා සලකා බලන ලද අතර එකී නිර්දේශයන් ක්‍රියාත්මක කිරීමට 2025.12.26 දින සභාව අනුමත කරන ලදි.

**ඌ). ලැබිම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශන එකතු කළ ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තා හා සභාගත කළ යුතු වෙනත් ලේඛණ**

ලැබිම් හා වියදම් පිළිබඳ 2025 නොවැම්බර් මස මාසික ප්‍රකාශන එකතු කළ ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තාව ගරු සභාව විසින් පිළිගන්නා ලදි.

**උ.වෙනත් කරුණු**

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.එම්.දයාරත්න මැතිතුමා**

ගරු සභාපතිතුමනි,සියලුම මන්ත්‍රිවරුන්ගේ දැන ගැනිම සඳහා මා කරුණු කිහිපයක් ඉදිරිපත් කිරිමට බලාපොරොත්තුවනවා.ඒ අනුව අපට පානීය ජලය අවශ්‍යතාවය සපුරාලනු ලබන්නේ සභාවෙන් හා ජලසම්පාදන මණ්ඩලය තුලිනි.ග්‍රාමීය ජනතාවට ප්‍රජා ජල ව්‍යාපෘතිය මගින් ජලය ලබා දෙනු ලබනවා.එසේම බදුල්ල ප්‍රජා ජල දෙපාර්තමේන්තුව විසින් රත්කරව්ව ප්‍රජා ජල ව්‍යාපෘතිය සඳහා වසීප් ආයතනයෙන් සඳහා කෝටි 05 ක මූල්‍යමය දායකත්වයක් ලබාදුන් අතර එසේම පිටපෙළ සඳහා කෝටි 04 ක් ද,එනමල් අරාව කෝටි 04 ක්ද,කන්දේ පුහුල්පොල සඳහා කෝටි ½ක ක්ද,උඩුබාදන සඳහා කෝටි 08 ක් වශයෙන් ප්‍රජා ජල ව්‍යාපෘති සඳහා වසීප් ආයතනයෙන් මූල්‍යමය දායකත්වය ලබා දි ඇත.ප්‍රජා ජල දෙපාර්තමේන්තුවට මෙම වසීප් ආයතනය මඟින් ලබාදුන් මූල්‍යමය දායකත්වය මෙම වසරේ දෙසැම්බර් 31 වන දිනෙන් කාලය අවසන් වන අතර මෙමආයතනය හරහා ලබාදුන් මූල්‍යමය දායකත්වය හරහා ජනතාවට විශාල සේවයක් කිරිමට හැකි වුණා. එබැවින්,ඉදිරියටත් මෙවැනි ව්‍යාපෘති ලැබෙනවා නම් ජනතාවට විශාල සේවයක් කිරිමට අවස්ථාව ලැබෙනවා.

තවද පළාත් පාලන ආයතනවලට ලෝක බැංකුවෙන් ලබාදුන් LDSP ව්‍යාපෘතිය හරහා 2019 වර්ෂයේ සිට 2024 වර්ෂයේ දෙසැම්බර් මසයෙන් අවසන් විය. මෙමඟින්ද,අප සභාවට කෝටි 15 කට වැඩි මූල්‍යමය අධාර ලැබුණා .මේ තුලින් අප සභාවට ආර්ථික වශයෙනුත්.වත්කම් වශයෙනුත් විශාල ප්‍රතිලාභයක් ලැබුණා.

එසේම කෘෂිකර්මාන්ත දෙපාර්තමෙන්තුව විසින් හරිතාගාර තුළ වගා කිරිම සඳහා ව්‍යාපෘති හඳුන්වා දි තිබෙන අතර මුළු රටම ආපදාතත්ත්වයකට පත්ව සිටින මෙවැනි කාල සීමාවක් තුළ දි අප ප්‍රේද්ශයේ ජනතාවටද හරිතාගාර තුළවගා කිරිමට අවස්ථාව ලැබෙන්නේ නම් එය ඉතාමත් වටිනා දෙයකි.ඒවගේම අයහපත් කාළගුණය හේතුවෙන් කොට්ඨාශ 24 තුළම අතුරු මාර්ගයන් පිළිසකර කිරිමට සිදු වෙලා තියෙනවා.අප සභාවේ JCB යන්ත්‍රය අළුත්වැඩියා කිරිමට සිදුව ඇති බැවින්,බදු පදනම මත හෝ JCB යන්ත්‍රයක් ලබාගෙන එක් මන්ත්‍රිවරයෙකුට දින දෙකක් වනසේ මන්ත්‍රිවරු 44 දෙනා සඳහාම ඔවුන්ගේ ප්‍රදේශයේ මාර්ග ප්‍රතිසංස්කරණය කිරිමට වැඩ පිළිවෙළක් සකස් කිරිමට JCB යන්ත්‍රයක් ලබාදෙන ලෙස මා ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනි ශාන්තා ප්‍රසාදි දේශානි මැතිනිය**

ගරු සභාපතිතුමනි,බොරලන්ද නගරයේ ඉන්ධන පිරවුම්හල අසල දිරාපත් වුණු ගස් දෙකක් තිබෙන අතර මෙම ගස් ඉවත් කිරිම් නොකලහොත් අනපේක්ෂිත හානියක් සිදු විය හැකිය.මේ කෙරෙහිත්,ඔබතුමාගේ අවධානය යොමු කරන ලෙස මා ඉල්ලා සිටින අතර අයහපත් කාලගුණය හේතුවෙන් අවහිර වු මාර්ගද හැකි ඉක්මණින් පිළිසකර කර දෙන ලෙසත් මා ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ප්‍රභාත් රවීන්ද්‍ර මැතිතුමා**

ගරු සභාපතිතුමනි,පසුගිය මාසයේ ලංකාවට බලපෑ කුණාටුව හේතුවෙන් ජනතාව විශාල වශයෙන් අපදාවන්ට ලක් වුණා.ඒ සියලූ දෙනා වෙනුවෙන් මාගේ කණගාටුව මේ අවස්ථාවේ දි ප්‍රකාශ කර සිටිනවා. මේවන විටත් ආපදාවන්ට ලක් වු ජනතාව කඳවුරුවල රැඳි සිටිනවා.වැලිමඩ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ කැප්පෙටිපොල සිට හග්ගල දක්වා මාර්ගයයේ ප්‍රෙද්ශවාසින්ද ආපදාවට මුහුණ දිමට සිදු වුණා.මෙම ආපදාවට මුහුණදුන් ජනතාවසුරක්ෂිත මධ්‍යස්ථාවලත්,ඇතමෙක් ඥාති නිවෙස්ව ලත් ජිවත් වෙනවා.මෙහිදි සුරක්ෂිත මධ්‍යස්ථානවල සිටින ජනතාව සදහා රජය මගින් ඔවුන්හට සහන සැලසුවද, ඥාති නිවෙස් කරා ගිය ජනතාව වෙනුවෙන් ආණ්ඩුව මැදිහත් වුනේ නෑ.මේ පිළිබඳව මාගේ කණගාටුව ප්‍රකාශ කර සිටිනවා.එවගේම ඔවුන් වෙනුවෙන් සභාව මැදිහත් වි යම් වැඩ පිළිවෙලක් සකස් කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.එම්.හුසෙයින් මැතිතුමා**

ගරු සභාපතිතුමනි,2004 වර්ෂයේ දෙසැම්බර් මස 26 වන දින සිදු වු සුනාමි සිදුවිම නිසා අප රටට ජිවිත හානි 35,000 ක් අහිමි විය.එසේම 2020 ජනවාරි මස කොරෝනා වසංගතය පැමිණි අතර 2019

2025 නොවැම්බර් මස ඇති වු කුණාටුව හේතුවෙන් ජිවිතවලටත්,දේපලවලටත්ථවිශාල හානියක් සිදු විය.මේ අවස්ථාවේදී ජනාධිපතිතුමා හා දැනට සිටින රජය විසින් ජාති භේදයකින් තොරව සැමදෙනාටම එක හා සමානව අසාධාරණයකින් තොරව කටයුතු කල ආකාරය අප දුටුවා.මේ පිළිබඳව මුස්ලිම්වරුන් ලෙස අප කෘතඥතාවය පළ කර සිටිමු.

තවද මීට පෙර වර්ෂවල සිදු වු ආපදාවන්හිදී ලබා දුන් වරප්‍රසාදවලට වඩා වැඩි වරප්‍රසාද ප්‍රමාණයක් මේ රජය විසින් ලබා දි තිබෙනවා.එමෙන්ම ගුරුතලාව ප්‍ර දේශයේ නාය යෑමෙන් සිදු වු හානි කෙරෙහි අවධානය යොමු කරමින් මෙය මුස්ලිම් ගම්මානයක් යැයි නොසිතා ගරු සභාපතිතුමන් විසින් ශ්‍රමදානයක් සංවිධානය කර එම කටයුතු සිදු කරනු ලැබුවා.තවද ලංකා ටයිල්ස් ආයතනය,පැල්වත්ත සීනි සමාගම යන ආයතනවලින්ද අප ගමට සහයෝගය ලබා දුන් අතර බෝහෝ දෙනෙකු විසින් ආපදා සහන ලබා දිමේ දි අඩුපාඩු සදහන් කතා කළා නමුත් පීඩාවට පත් ජනතාව වෙනුවෙන් මෙම රජය මැදිහත් වි සිදු කලසේවාව අප අගය කල යුතුය.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඉන්දික සේනාරත්න මැතිතුමා**

ගරු සභාපතිතුමනි,පසුගිය ව්‍යසනය තුළ දි ගාල්ල දිස්ත්‍රික්කයෙන් කෝටි 03ක පමණ භාණ්ඩ අප ප්‍රෙද්ශයේ ආපදාවන්ට ලක්වු අය සදහා බෙදා දිම එවනු ලැබුවා.එම අධාර අපදාවන්ට ලක් වු අයට පක්ෂ,ජාති භේදයකින් තොරව ලබා දිමට මට හැකියාව ලැබුණු අතර මේ සම්බන්ධයෙන් ගාල්ල දිස්ත්‍රික්කයේ සර්ව ජන බලවේගයේ කණ්ඩායමට මා ස්තුති වන්ත වෙනවා.එසේම ගරු සභාපතිතුමනි,දෙරණ ආයතනයේ අප සහෝදරයෙක් සිටින බැවින්,අපට ආධාර ලබා ගැනිමට හැකියාව තිබේ.මේ නිසා ඔබතුමා ලිපියක් ලබා දෙන්නේ නම් අපට ආධාර ගැනිමේ හැකියාවක් පවතිනවා.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනි සිත්ති හුසෙයිමා මැතිණිය**

ගරු සභාපතිතුමනි,ආපදාව හේතුවෙන් ගුරුතලාව කොට්ඨාශයේ ඇළ කැඩිගොස් තිබුණ අතර එය සභාවේ මන්ත්‍රිවරුන් විසින් ශ්‍රමදානයක් පවත්වා පිලිසකර කර දුන්නා.මේ පිළිබඳව මාගේ සතුට මේ අවස්ථාවේ දිප්‍රකාශ කර සිටිනවා.එසේම හපුරෝද ගම්මානයේ ප්‍රජා ජල යෝජනා ක්‍රමය සඳහා ගමේ මිනිසුන්ගෙන් මුදල් අය නොකර සභාවේ මුදලින් එය කර දෙන මෙන් මා ඉල්ලා සිටිනවා.එසේම හපුරෝද ගම්මානයේ මිනිසුන්ගෙන් එකතු වු රුපියල් ලක්ෂ 05ක අධාර ආපදාවන්ට ලක් වු අයට බෙදා දිමට අපට හැකි විය. එසේම බෝගහකුඹුර හා ගම්පොළ ප්‍රෙද්ශයටත් අපට අධාර බෙදා දිමට හැකිවුණා.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එන් .එම්.කරුණාදාස මැතිතුමා**

ගරු සභාපතිතුමනි,කන්දේ පුහුල් පොල වසමේ ඇළ අසල වූ පවුලක් ජල පහරට ලක් වී එයින් ජීවිත හානි දෙකක් සිදු වුණා.මෙහි දි එම ඇළ මාර්ගය අසල පාලමක් තිබුණා නම් මෙම මෙම ඛේදනිය තත්වය ඇති නොවන්නට ඉඩකඩ තිබුණා.එසේම මාගේ කොට්ඨාශ තුනේම අර්ධ වශයෙන් ගෙවල් 18කට හානි සිදු වූ අතර මෙම කුණාටුවෙන් අවතැන් වූ පුද්ගලයින් සඳහා අපගේ නියෝජිතයින් පමණක් නොව පිට පළාත්වලින්ද පැමිණ උදව් කළා.ඒ පිළිබඳව මාගේ සතුට මේ අවස්ථාවේ දි පුද කර සිටිනවා.තවද මෙම ව්‍යසන තත්වයෙන් නැගී සිටීමට වැලිමඩ ප්‍රාදේශිය සභාවේ මන්ත්‍රිවරුන් ලෙස අපගේ මාසික වැටුප ලබා දෙමු යැයි මා යෝජනා කර සිටිනවා.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජබාර් තුවාන් කාසීම් මැතිතුමා**

ගරු සභාපතිතුමනි, අපට සිකුරාදා දිනයේදි අපගේ ආගමික වතාවත් කරන්නට තිබෙන බැවින්,සිකුරාදා දිනය සභාව යොදා නොගන්නා ලෙස ඉල්ලා සිටිනවා.තවද සභාව ආරම්භ වූ දිනයේ සිටම පාරවල් සැකසීම සඳහා JCB යන්ත්‍රය ඉල්ලා සිටි නමුත් එය අළුත්වැඩියා කිරිමට ඇති බැවින් ලබා දිමට නොහැකි වි ඇත. එම නිසා ප්‍රාදේශිය සභාවේ මුදල් මඟින් හෝ බැකෝ යන්ත්‍රයක් මිල දි ගන්නා ලෙස මා ඉල්ලා සිටිනවා.එසේම ගරු සභාපතිතුමනි ඔබතුමාගේ බලතල යොදා ගෙන හෝඋමා ඔය අසල අනවසරයෙන් ඉදි කර ඇති ගොඩනැඟිලි ඉවත් කිරිම සඳහා ක්‍රියාමාර්ග ගන්නා ලෙස මා ඉල්ලා සිටිනවා.

තවද,මන්ත්‍රි හැඳුනුම්පත ද කඩිනමින් ලබා දෙන ලෙස ඉල්ලා සිටින අතර පසුගිය ආපදා අවස්ථාවේදි වැලිමඩ බල ප්‍රෙද්ශයේ ආපදාවට ලක් වූ අය සඳහා සහන සැලසිම සඳහා මැදිහත් වූ ගරු සභාපතිතුමා ,ලේකම්තුමා ඇතුළු සියලු දෙනාට මාගේ ස්තුතිය මේ අවස්ථාවේ දි ප්‍රකාශ කර සිටිනවා.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩි.එම්.පද්මිණි දිසානායක මැතිණිය**

ගරු සභාපතිතුමනි,පසුගිය 26 වන දින සිදු වූ ආපදා තත්වය පිළිබඳව දැනුවත් කිරිමට ආපදා කමිටුවක් පත් කර තිබුනද අප ඒ පිළිබඳව දැනුවත් නැත.මා ද එම ආපදාවට මුහුණ දුන් නමුත් මාහට හා අපගේ ප්‍රදේශයේ ආපදාවට ලක්වූ අයට ආපදා සහන ලැබුනේ නෑ.එයට මාගේ කණගාටුව ප්‍රකාශ කර සිටිනවා.එසේම පරිසර කමිටුවේ දි ගනු ලැබූ තීරණයක් මත සුසාන භූමි පරික්ෂා කිරිමට දින යොදා ගෙන තිබුන නමුත් එදිනට කලින් එම සුසාන භූමි පරික්ෂාව සිදු කර තියෙනවා.මේ පිළිබඳව අපව දැනුවත් කිරිම් කළේ නෑ.නැවත එසේ නොකරන ලෙස මා ඉල්ලා සිටිනවා.

ප්‍රාදේශීය සභා මන්ත්‍රී මොහොමඩ් හලීම් මොහොමඩ් ෆායිස් සයිබු මැතිතුමා,ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ. එම්. හුසෙයින් මැතිතුමා හා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. ජබාර් තුවාන්කාසිම් මැතිතුමා ප.ව 12.05ට සභාවෙන් පිටව යන ලදි.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ටි.එම්.චන්ද්‍රිකා තෙන්නකෝන් මැතිණිය**

ගරු සභාපතිතුමනි,වංගිය කුඹුරේ ඇති වූ ඛේදවාචකබය පිළිබඳව මාගේ කණගාටුව ප්‍රකාශ කර සිටන අතර 2015 සභාවේ සිට මේ ස්ථානයේ පාලමක් සකස් කරන ලෙස ඉල්ලා සිටියත් එය ඉටුවුයේ නැත.නැවතත් මෙවැනි ඛේදවාචකයක් ඇති වන්නට පෙර මේ සම්බන්ධයෙන් වැඩපිළිවෙලක් සකස් කරන ලෙස මා ඉල්ලා සිටිනවා.විශේෂයෙන් මෙය ප්‍රදේශ කිහිපයකට යන ප්‍රධාන මාර්ගයක් වන බැවින්,එය කෙරෙහි ඔබතුමාගේ අවධානය යොමු කරන ලෙස ඉල්ලා සිටින අතර JCB යන්ත්‍රය යොදා ගෙන පිළිසකර කිරිමට ඇති මාර්ග සකස් කර දෙන ලෙසත් ඉල්ලා සිටිනවා.

තවද මෙම ව්‍යසනයට පත්වූ මාර්ග සියල්ල ලේඛණගත කර සභා අනුමැතියක් ලබා ගෙන ගොඩනැඟිලි පර්යේෂණ ආයතනය මඟින් (NBRO) වාර්තාවක් ලබා ගැනිමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙසත් මා ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.පි.පි ජමිත් මැතිතුමා**

ගරු සභාපතිතුමනි, දිට්වා කුණාටුව හේතුවෙන් මාගේ කොට්ඨාශය විශාල වශයෙන් ආපදාට ලක්වුවා.එසේම මෙහි දි ආපාවන්ට ලක්වූ අය සඳහා රජය විසින් අධාර ලබා දිමට අවශය කටයුතු කරනු ලැබුවා. මීරහවත්ත කොටසේ ආපදාවන්ට ලක්වූ අයටද ආධාර ලබා දුන් අතර සභාව කියෝජනය කරන ගරු පද්මිණී මන්ත්‍රීතුමිය ආධාර ලබා නොදුන් බව පැවසුවත්, එතුමියගේ නම ද රු:50000.00ක දීමනාව ලබාගත් නාම ලේඛනයේ සටහන් වී තිබෙනවා.

ගරු උප සභාපති එල්.එම්.සෆ්වාන් මැතිතුමා හාජේ.එම්.ඉන්දික සම්පත් මැතිතුමා ප.ව 12.15 ට සභාවෙන් පිටව යන ලදි.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.සිසිර දිලාන් ජයතිලක මැතිතුමා**

ගරු සභාපතිතුමනි,පසුගිය දින පැවති අයහපත් කාලගුණය හේතුවෙන් ව්‍යසනයට ලක් වූ සියලු දෙනා වෙනුවෙන් කණගාටුව ප්‍රකාශ කර සිටන අතර ගරු සභාපති,ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලය මේ අවස්ථාවේ දි කැපවීමෙන් කටුයුතු කරනු ලැබුවා.මේ සම්බන්ධයෙන් ඔවුනට මාගේ ස්තුතිය පුද කර සිටිනවා.එසේම අයට කඳවුරු වල ,නිවාසවල සිටින අවතැන් වූ අය වෙනුවෙන් අපට ලැබුණු අධාර ලබා දිමේ දි ප්‍රාදේශිය සභාව,ප්‍රාදේශිය ලේකම් කාර්යාලය,ග්‍රාම නිලධාරි ඇතුළු රාජ්‍ය නිලධාරින් මැදිහත් වි කැපවීමෙන් කටයුතු කරනු ලැබුවා.තවද,පොදු ජන ජීවිතය නැවත ගොඩනගා ගැනිමට පක්ෂ විපක්ෂ භේදයකින් තොරව ඔබතුමාගේ මැදිහත්වීමෙන් කටයුතු කරන ලෙස මා ඉල්ලා සිටින අතර පදික වෙළඳුන් පිළිබඳවත් අවධානය යොමු කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එනස්ට් ඩෙන්සිල් ස්ලේඩන් මැතිතුමා**

ගරු සභාපතිතුමනි,පසුගියදා ඇති වූ කුණාටුව හේතුවෙන් ලංකාවේ ජීවිත විශාල ප්‍රමාණයක් අපට අහිමි වුණා.අප ප්‍රදේශයේ කිහිප දෙනෙකුගේත් දිවි අහිමි වුණා.මේ සම්බන්ධයෙන් කණගාටු වෙනවා මෙන්ම අප දැන් කල යුත්තේ,විපක්ෂ භේදයකින් තොරව මේ ව්‍යසනයෙන් ජය ගැනිමට කටයුතු කිරිමයි.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.එම්.චාමර ප්‍රසාද් මැතිතුමා**

ගරු සභාපතිතුමනි,බොරලන්ද කොට්ඨාශයේ මාගේ වසම් තුනම ආපදාවන්ට මුහුණ දුන්නා .ඒ අයට මාගේ ශෝකය ප්‍රකාශ කර සිටිනවා.මෙහි දි ජීවිත ආරක්ෂා කර ගැනිම සඳහා ගමේ මිනිසුන් ආපදා මධ්‍යස්ථානවලට හා ඥාති නිවෙස්වලට යොමු කරනු ලැබුවා.ඔවුන් සම්බන්ධයෙන් රාජ්‍ය නිලධාරින් විසින් නිරන්තරයෙන් සොයා බැලිම් කටයුතු සිදු කරනු ලැබු අතර රජය විසින් ආධාර ලබා දිම් කටයුතු ද සිදු කරනු ලැබුවා.ගරු මන්ත්‍රී චන්ද්‍රකා තෙන්නකෝන් මන්ත්‍රීතුමිය විසින් වංගියකුඹුර යන ස්ථානයේ පාලමක් සකස් කරන ලෙස ඉල්ලා සිටියත් එය ඉටුවුයේ නැති බව පවසා සිටියා.මන්ත්‍රීතුමියනි, වංගියකුඹුර පාලම සැකසීම 2026 වර්ෂයේ සංවර්ධන යෝජනා යටතේ ඇතුළත් කර තිබෙනවා.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රි එච්.එම්.ඉන්දික සේනාරත්න මැතිතුමා, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රි හා මන්ත්‍රි ඒ .ඒ.ඩි.අමිත අමරසූරිය මැතිතුමා, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රි එම්.සිසිර දිලාන් ජයතිලක මැතිතුමා. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රි කේ.මුත්තුකුමාර් මැතිතුමා, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රි එම්.එම්.දයාරත්න මැතිතුමා හා ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රි ඩි.එම්.පද්මිණි දිසානායක මැතිනිය ප.ව 1.10 ට සභාවෙන් පිටව යන ලදි.

**ගරු සභාපති ඩී.එම්.අජිත් කුමාර දිසානායක මැතිතුමා,**

ගරු මන්ත්‍රීතුමන්ලා සහ තුමියන්ලා කිහිප දෙනෙකු විසින් අදහස් ඉදිරිපත් කරනු ලැබුවා.ඒ අදහස් දැක්වූ සියලුම මන්ත්‍රීතුමන්ලාගේ අදහස් ප්‍රකාශ කිරීමේදී පෙනී යන්නේ 2025.11.26,27 යන දින දෙක තුළ සිදු වූ ආපදා තත්වය හා එහිදී පැනනැඟුණු ගැටලු හා ඊට අදාළ මැදිහත් වීම් පිළිබඳවයි.

දිට්වා සුළි කුණාටුව නිසා සිදු වූ ව්‍යසනය 2004 දෙසැම්බර් මස 26 දින සුනාමිය නිසා සිදුවූ ව්‍යසනය මෙන් හය හත් ගුණයක් පමණ වේ යැයි දැනට වාර්තා සාදමින් සිටි.ඒ වගේම 2025.01.24 දින වනවිට ලෝක බැංකුව විසින් මේ ආපදා තත්වයේ හානිය ඇමරිකන් ඩොලර් බිලියන 7.1ක් බව හා දළ ජාතික නිෂ්පාදිතයෙන් 4% ක් විනාශ වී ඇති බවත් වාර්තා වී තිබෙනවා. තවද මුළු රටේම පුරවැසියන් මිලියන දෙකක් පමණ අවතැන් වී තිබෙන අතර මාර්ග හා පාලම් පිළිබඳ හානිය ඇමරිකන් ඩොලර් කෝටි 173.5 ක් වෙනවා.

බදුල්ල දිස්ත්‍රික්කය මේ ආපදා තත්වයට ලක්වූ දිස්ත්‍රික්ක අතරින් තුන්වන ස්ථානය වන අතර මේ මාසයක කාලය තුළදී අපි මැදිහත් වී මිනිසුන්ගේ ජීවිත පවත්වාගෙන යාමට අවශ්‍ය සියලු පහසුකම් වලට අදාළ මූලික දේවල් සිදු කිරීමට හැකි වී තිබෙනවා. එබැවින් මේ ආපදා තත්වය කළමනාකරණය කිරීමට සිදු වූ මැදිහත් වීම්වලදී දිස්ත්‍රික්ක අතරින් පළමු ස්ථානය බදුල්ල දිස්ත්‍රික්කයට ලැබී තියෙනවා.

අප ප්‍රදේශයේ සිදු වූ ආපදා තත්වයට සහය ලබා දීමට මාතර,හම්බන්තොට යන ප්‍රදේශවලින් කණ්ඩායම් ඇවිත් අපට සහය දැක්වූවා.ඔවුන්ට අපගේ ස්තුතිය පුදකර සිටිනවා.එසේ කණ්ඩායම් ඇවිත් මෙම ප්‍රෙද්ශයේ මැදිහත්වීම් සිදු කරද්දී අපේ ප්රෙද්ශයේ සමහර අය ඔවුන්ගේ පංගුව වෙන් කර ගැනීමට අදාළ කටයුතු සිදු කරනු ලැබූ බව අපි දුටුවා.

මේ සිදු වීම සිදු වුණේ පසුගිය මාසයේ 27 වනදාය.දිස්ත්‍රික් ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් සමන්ත විද්‍යාරත්න ඇමතිතුමා,පාර්ලිමේන්තු මන්ත්‍රීවරු,සභාපතිවරුන්,සියලුම රාජ්‍ය නිලධාරින් ,එකතුවෙලා මේ කමිටුව කැඳවලා පළමු දින පෙ:ව:7.00ට කමිටුව පටන් ගෙන පාන්දර 2.00 පමණ වන විට අවසන් වුණා. එසේ කටයුතු සිදු කරමින් බදුල්ල දිස්ත්‍රික්කය පළමු වන තැනට ගේන්න පුළුවන් වුණා.ඉන්පසු ප්‍රාදේශීය ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් ආපදා කළමනාකරණ කමිටුව සකස් කර ඉදිරි කටයුතු සිදු කරනු ලැබුවා.එසේ කටයුතු සිදු කරමින් මෙවන් විනාශකාරී තත්වයන් යථා තත්වයට පත්කර ගැනීමට හැකිවුණා.

ඒවගේම කෘෂිකර්මාන්තයට අදාළව ඇලවල්වලට හා වැව් අමුණුවලට හානි සිදුවී තිබුණා.ඒවා පිළිසකර කිරීම සඳහා වාරි ඉංජිනේරුවන් අවුරුදු 02ක පමණ කාලයක් ගතවන බව ප්‍රකාශ කරත් අපට කණ්ඩායම් කැඳවලා සාකච්ඡා කරලා සියලු මැදිහත් වීම් සිදු කර ජලය ලබා ගැනීමට අවශ්‍ය මැදිහත්වීම් සිදු කර ගැනීමට හැකි වුණා.

ඊළඟට මේ වන විට දරුවන්ට අධ්‍යාපනය ලැබීමට පාසල් විවෘත කිරීමේ කටයුතු සංවිධානය කර එම කටයුතු සිදු කරනු ලැබුවා.

ඒ වගේම ලේකම්තුමාගේ මැදිහත් වීමත් එක්ක වැලිමඩ ප්‍රාදේශීය සභාව විදිහට මේ ව්‍යසනයට දැවැන්ත මැදිහත් වීමක් සිදු කළා.පසුගිය නොවැම්බර් 27 වන දා ව්‍යසනය සිදු වූ අතර 28 වන දින සියලු මන්ත්‍රීවරුන්ට ඒ සඳහා සාකච්ඡාවක් පැවැත්වීමට පැමිණෙන ලෙස දැන්වූවත් කියන්න කණගාටුයි ගරු සිසිර දිලාන් මන්ත්‍රීතුමා පමණක් පැමිණියා.ඉන්පසු ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලය සියලු කටයුතු සංවිධානය කර වැඩ කටයුතු සිදු කරනු ලැබු වා. මේවන විට සභාව මැදිහත් වී අවතැන් වූ අය සඳහා වියළි ආහාර ද්‍රව්‍ය,සනීපාරක්ෂක ද්‍රව්‍ය,ඇඳුම් පැළඳුම්, යනාදිය ඔවුන්ට සැපයීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබු අතර මීගහකිවුල පාසලේ ශ්‍රමදානයක්ද පැවැත්වූවා.

ඒ නිසා මා යෝජනා කරන්නේ ඔබට මේ ව්‍යසනය දේශපාලනය කර නොගෙන ඕන තරම් දේශපාලනය කරන ලෙසයි. තවද අප ප්‍රාදේශීය සභාව ද ආපදාවට ලක් වුණු අතර ඒත් මන්ත්‍රීවරුන් කී දෙනාද මොනාද වෙලා තියෙන්නෙ කියලා සොයා බැලුවේ.ඒ නිසා අපි මේ ආපදාව ආශිර්වාදයක් කරගෙන අළුත් රටක් හදන්න අදාළ මැදිහත්වීම සිදු කරමු. මේ අවුරුද්දේ අවසන් මහ සභාව අද දින පවත්වනු ලබන අතර ලබන වසරේ සිට තුන්වන සතියේ බ්‍රහස්ප්‍රතින්දා දින මහ සභාව පැවැත් වෙනවා.ඒ අනුව 2026 වර්ෂයේ ජනවාරි මස මහ සභාව 22 දින පැවැත්වීමට නියමිතව ඇත. ඒ වගේම මේ ආපදා තත්වය මත විකල්ප ස්ථානයකට යාමේ කටයුතු සිදුකරනවා. අළුතින් දකින අළුත් මැදිහත්වීමක් කරන කණ්ඩායමක් බවට පත්වී තියෙන තත්වයෙන් ගොඩ ඒමට අවශ්‍ය මැදිහත්වීම් සිදු කිරීමට ඔබ සැමට ශක්තිය ධෛර්ය ලැබේවායි මා ප්‍රාර්ථනා කරනවා.

ඉන් අනතුරුව ගරු සභාපතිතුමන් විසින් සහභාගි වූ සියලු මන්ත්‍රීවරුන්ටත් ,කාර්ය මණ්ඩලයටත්, ස්තුතිය පුද කර සිටින ලදි. මීළඟ සභාව 2026 ජනවාරි මස 22 වන දින මහා සභා රැස්වීම පැවැත්වෙන බව ගරු සභාපතිතුමා විසින් සභාවට දැනුම් දෙමින් සභාවේ වැඩ කටයුතු පෙ.ව 2. 30 ට පමණ නිමා කරන ලදි.

සභාපති,
ප්‍රාදේශීය සභාව,
වැලිමඩ

\

මෙම සභා වාර්තාව ............................................... වන දින පැවති මහ සභාවේ දි ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී/මන්ත්‍රීණී .....................................................................මැතිතුමා/මැතිණියගේ යෝජනාවෙන් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී/මන්ත්‍රීණී.................................................... මැතිතුමා/මැතිණියගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව/බහුතර ඡන්දයෙන් සංශෝධනයන්ට යටත්ව සභා සම්මත විය.